**ශීර්ෂය 203 - ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 203 - ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 නොවැම්බර් 20 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

---------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 176.37 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 159.74 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 16.63 ක් හෙවත් සියයට 9.43 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 152.27 | 137.91 | 14.36 | 9.43 |
| මූලධන | 24.10 | 21.83 | 2.27 | 9.42 |
| **එකතුව** | **176.37** | **159.74** | **16.63** | **9.43** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 20301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 2.00 | 1.99 | 0.70 | 0.96 | 6.50 | 3.92 |

**2.3 විගණන නිරීක්ෂණය**

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 33 ක සිට සියයට 88 දක්වා වන පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි .

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 20301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.40,178 ක් වූ අතර, එම හිඟහිටි ශේෂවලින් රු.20,000 ක් 2017 වර්ෂය තුළදී අයකරගෙන තිබුණි. තව දුරටත් අය කර ගත යුතු ශේෂය රු.20,178 ක් වී තිබුණි.

**3.3 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය**

**3.3.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ, එක් එක් වැය විෂයයන් යටතේ වූ මූල්‍ය වටිනාකම් හැර ප්‍රතිලාභ සැලසෙන පල්ලි, දේවස්ථාන, පදවි, ක්‍රියාත්මක කරන වැඩසටහන් ගණන හා ප්‍රතිලාභ ලබන දහම්පාසල් ගුරුවරුන් ගණන ආදි සංඛ්‍යාත්මක වටිනාකම් දක්වා නොතිබුණි. මේ නිසා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික කාර්යසාධන වාර්තාව මගින් සන්සන්දනාත්මක තොරතුරු ලබා ගැනීමට නොහැකි විය.

**3.3.2 අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා අංශ 3 ක් යටතේ විෂයයන් 27 ක් ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර තිබුණි. නමුත් 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර නොතිබුණි.

**3.4 කාර්යසාධනය**

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

**කිතුණු සාහිත්‍ය උළෙල**

2016 වර්ෂයේ කිතුණු සාහිත්‍ය උළෙලේ දිසා හා පදවි නාට්‍ය තරග සඳහා පදවි 11 කට එකතුව රු.1,020,964 ක් ලබා දී තිබුණි. කිතුණු සාහිත්‍ය උළෙලේ තරග විනිශ්චයකරුවන් සඳහා ගෙවීම් කිරීමේදී එක් එක් පදවි සඳහා විවිධ ප්‍රමාණයන්ගෙන් ගෙවීම් කර තිබුණි. ඒ අනුව තරග විනිශ්චයකරුවන්ට ගෙවීම් කිරීමේදී පොදු එකඟතාවයක් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3.5 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 03 | 02 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 01 | - | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 55 | 35 | 20 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 07 | 04 | 03 |
| | **එකතුව** | **66** | **41** | **25** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව 66 ක් වුවද 2016 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය 41 ක් වී තිබුණි. ඒ අනුව 25 දෙනෙකුගේ පුරප්පාඩු නිරීක්ෂණය විය. වර්ෂ 04 ක පමණ කාලයක සිට ගණකාධිකාරී තනතුර පුරප්පාඩුව පවතින අතර දෙපාර්තමේන්තුව ආරම්භයේ සිටම පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩුව පැවතුණි.